ජාතික තරුණ සේවා සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ ("සභාව") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත සහ 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- සභාව යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සභාව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සභාව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර 07 - දේපළ පිරියත හා උපකරණ හි 49 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයට අයත් පිළිවෙළින් ඉඩම් හා ගොඩනැගිලි පමණක් රු.මිලියන 319.27ක් හා රු.මිලියන 56.72 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණි.	තක්සේරු වාර්තා ලැබීමෙන් පසු මෙම වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කල අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පෙර වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 12ක් මගින් මිලදීගෙන තිබුණු රු. මිලියන 15.46ක් වටිනා වත්කම් සභාව වෙත ලබාදී තිබුණද ,එම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සභාව යටතේ පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සමාජයට අදාළ ගණුදෙණු ඇතුළත් එකතුව රු. මිලියන 31.17 ක ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීමේ ශේෂ හා ජංගම ගිණුම් ශේෂ යනාදිය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණු අතර යෞවන තිළිණ ප්‍රදාන අංශයේ රු. මිලියන 2.03 ක ජංගම ගිණුමේ ශේෂය සහ 2008 වර්ෂයේ සිට සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමය වෙත ගෙවිය යුතු රු. මිලියන 2.19 ක් හා ක්‍රීඩා සමාජයෙන් ණය පදනම මත ලබාගත් රු. මිලියන 1.52 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියන් මත හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.	ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල වන පරිදි ගිණුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවන ලද රු.මිලියන 2.48ක විදුලි ගාස්තු උපචිත වියදම් ලෙසද ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය හා උපචිත වියදම් ගිණුමේ වටිනාකම එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.	දැනට ජ්නල් සටහන් මගින් නිවැරදි කර ඇත.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

(ඇ)	කොන්ත්‍රාත්කරුවෙකුගෙන් අයකර ගන්නා ලද රු.මිලියන 1.45ක ප්‍රමාද ගාස්තු (Liquidated Damages) හා නියමිත කාලය තුළ කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම මත ගෙවන ලද රු.මිලියන 2.82ක් ප්‍රමාද පොළිය පිළිවෙළින් ආදායම් හා වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගෙන එම වටිනාකම් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 1.37 කින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(ඉ)	2024 වර්ෂයේ විශ්‍රාම ගිය නිළධාරීන්ට ගෙවිය යුතු රු.මිලියන 6.09ක් මුදල පාරිතෝෂික ගිණුමෙහි දෙවරක් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ඌණතාවය හා ගෙවිය යුතු තැන්පත් ගිණුම එම වටිනාකමින් අධිගණනය වී තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(ඊ)	ලී බඩු, සවිකිරීම හා යන්ත්‍රෝපකරණ ක්ෂය ගණනය කිරීමේදී එය රු.මිලියන 3.76ක් අඩුවෙන් ගණනය කර තිබීමෙන් වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් ඌනගණනය වී තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	ක්ෂය නිවැරදිව ගණනය කර වෙන් කිරීමේ ගිණුම්වලට ගැලපිය යුතුය.

1.5.3 නොසැසඳුණු පාලන ගිණුම්

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.මිලියන	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මිලියන	වෙනස රු.මිලියන	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙත වූ ණයහිමි ශේෂය	13.02	211.44	198.42	2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අනුව ශ්‍රී ලංකා තරුණ සේවා සේවා සමාගම වෙත ගෙවිය යුතුව පවතින්නේ රු.13,024,479.00 ක ශේෂයක් පමණි.	නිවැරදි ණයහිමි ශේෂ හඳුනාගෙන එය නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.මිලියන	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙළඳ ණයගැතියන් හා අනෙකුත් ලැබිය යුතු දෑ	122.22	ශේෂ සනාථකිරීම්.	2025 වර්ෂයේදී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	විගණනය සිදු කිරීමට අදාළ සාක්ෂි නිසි පරිදි නොපමාව ඉදිරිපත් කළ යුතුය.
(ආ)	වෙළඳ ණය හිමියෝ හා ගෙවිය යුතු දෑ	12.83	ශේෂ සනාථකිරීම් .		
(ඇ)	**කෙරීගෙන යන වැඩ**	18.78	අදාළ ගෙවීම් වවුචර් හා ලිපිගොණු		
(ඈ)	Water Polo වැඩසටහනට සහය කණ්ඩායම සඳහා, මෙහි ප්‍රධාන තීරක වෙනුවෙන් ගෙවීම	0.13	ගෙවීම සම්බන්ධයෙන් සනාථකිරීම.		
(ඉ)	නැගී එන ක්‍රිකට් ක්‍රිඩාව සම්බන්ධයෙන් ගල්කිස්ස බර්ජායා හෝටලයේදි සිදු කරන ලද වැඩසටහන	1.52	තරුණයන් තෝරාගත් පදනම, සහභාගී වූ අයගේ නාම ලේඛන සහ සම්පත් දායකයන් පිළිබඳ තොරතුරු		
(ඊ)	රජයේ ප්‍රාග්ධන දායක ගිණුමේ ආරම්භක ශේෂය හා අවසාන ශේෂය සැසඳීමේදී අවසාන ශේෂයේ වැඩිවීම.	534.24	වර්ෂයට අදාළ ගණුදෙණු හා සිද්ධීන් පිළිබඳ තොරතුරු	මෙම ශේෂයන් ඉතා දිගු කාලයක සිට පැවත එන නාමමාත්‍රික (nominal) ශේෂයන්වේ.	රජයේ ප්‍රාග්ධන දායක ගිණුමේ වර්ධනයේ නිවැරදිතාවය නිශ්චය කර ගැනීමට අදාළ තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට සභාවේ ණයගැති ශේෂය රු. මිලියන 5.62 ක්වූ අතර, එම ශේෂය තුළ 2023 වර්ෂයේ යෞවන සමාජ සම්මේලනයට ලබාදී තිබූ රු. මිලියන 4ක ණය මුදලක් හා සැපයුම්කාර ආයතනයක් වෙත දෙවරක් ගෙවීම මත අයකර ගත යුතු රු. මිලියන 1.62ක ශේෂය වන අතර, මෙම මුදල් අයකර ගැනීම සඳහා මෙම වාර්තාවේ දිනය දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ආයතනය විසින්රු.100,000 ක මුදල් ජාතික තරුණ සේවා සභාව වෙත ගෙවීම් කර ඇති අතර ඉදිරියේදී මුදල් ලබා නොදුන හොත් නීති මඟින් කටයුතු කරනු ලැබේ.	ණය මුදල් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.මිලියන 374.76ක් විය. ඉන් රු. මිලියන 249.86 ක් එනම් 66% ක් තාරුණ්‍ය පීඩාවෙන් මුදවා ගැනීම යන තේමාව යටතේ සිදුකරන ලද වැඩසටහන් 06ක සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු ශේෂයක් වී තිබුණු අතර එම ශේෂය අය කර ගැනීම අවිනිෂ්චිතතාවයක් පැවතුණි.	ඉදිරියේදී අනුමත මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් පවත්නා අවිනිශ්චිතතාවයන් සැළකිල්ලට ගෙන කටයුතු කරනු ලැබේ.	ලැබිය යුතු දෑ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය	දේශීය අරමුදල් යොදවාගෙන විදේශ ගමන් යාම අත්හිටුවා තිබුණද ,අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉන්දියාව , මැලේසියාව හා නවසීලන්තය සංචාර වෙනුවෙන් රු811,485.ක් වැයකර තිබුණි .	සංචාරයන් සඳහා දැරීමට සිදුවන අවම වැය දරා ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී වී ඇති බව සඳහන් කරමි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය සතු ව්‍යාපාර සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය හා අත්පොත			
	මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1ඡේදය	සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කාර්ය හා කර්තව්‍යය අදාළ නීති මගින් ඒකාබද්ධ කර ඇති ඕනෑම අවස්ථාවක එම නෛතික පසුබිම ඒවා බෙදා වෙන් කිරීම් කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගතයුතු වුවද ,සභාවේ සභාපතිවරයා ලෙසත් ,ප්‍රධාන විධායක නිළධාරියෙකු ලෙසත් කටයුතු කරන සභාපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යය වෙන්කර දැනට පවතින පනත සංශෝධනය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිතය.	මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය.

(ඇ) 2021අප්‍රේල් 09 දිනැති අංක CGIR/2021/02/02 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය	සැපයුම්කරුවන් වෙත එකතු කළ අගය මත බදු ගෙවීම නැවත පරීක්ෂා කිරීම සඳහා නාම ලේඛණයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු වුවත් ,සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි .	ඉදිරියේ දී බදු ගෙවීම් පිළිබඳ වාර්තාවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබාදීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 531.23 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.මිලියන 68.27 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 462.96 ක තවදුරටත් පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහිමට පෙර වර්ෂයට සාපේක්ෂව තරුණ සංවර්ධන වියදම් රු.මිලියන 408.55 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමග සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල අගයන් එකී ප්‍රතිශතයන් සමග පහත දක්වා ඇත.

විස්තරය	2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන	2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන	වෙනස {වාසිදායක/ (අවාසිදායක)} රු.මිලියන	ප්‍රතිශතය %
ආදායම				

රජයේ දායකය - පුනරාවර්ථන	1333.36	1325.05	(291.69)	220.00
- සංවර්ධන	465.81	411.79	54.02	0.13
අභ්‍යන්තර ඉපයීම්	367.03	346.79	20.24	5.84
අමාත්‍යංශ හා වෙනත් ආයතන වලින් දායකත්වය	1902.15	1799.27	102.88	5.71
වියදම්				

ආයතන හා පරිපාලන	1494.91	1329.49	(165.42)	12.44
ක්ෂය වීම්	252.55	240.45	(12.10)	5.03
තරුණ සංවර්ධන වියදම්	1502.94	644.39	(858.55)	133.23

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සභාවේ පරිපාලන වියදම් රු.මිලියන 1,494.91 ක් වුවද ඊට සාපේක්ෂව අභ්‍යන්තර ඉපයීම් රු.මිලියන 367.03 පමණක් වුයෙන් පරිපාලන වියදම් වලට සරිලන අභ්‍යන්තර ඉපයීම්ද ලබා ගැනීමට සභාව අපොහොසත් වි

තිබුණි. තවද තරුණ සංවර්ධන වියදම් වලට වඩා ආයතන හා පර්පාලන වියදම් රු.මිලියන 441.97 ක් එනම් සියයට 41.97 කින් වැඩිවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහරගම තරුණ මධ්‍යස්ථානය සතු භෞතික සම්පත් සභාපතිවරයාගේ අභිමතය පරිදි සම්පූර්ණ මුදල් අයකිරීමකින් තොරව හෝ විවිධ වට්ටම් සහිතව බාහිර පාර්ශවයන් වෙත ලබා දීම තුලින් 2024වර්ෂය තුල සභාවට ලැබිය යුතුව තිබු රු.මිලියන 3.63 ක මුදලක් අහිමි වී ඇති බව විගණනය සඳහා ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය .	සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත කමිටුවක් මඟින් අදාළ කටයුතු සිදු කර පිරිවැයට සාපේක්ෂව මුදල් අයකර ගැනිමට ඉදිරියෙදි කටයුතු කරනු ලැබේ.	සභාවේ සම්පත් ඵලදායීව උපයෝජනය කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර එයට පටහැනිව කටයුතු කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පශු සම්පත් ඉතිරි තොගය රු.මිලියන 31.53ක් ලෙස දක්වා තිබුණද, ඉදිරිපත් කරන ලද ගොවිපොළ කාරක ගිණුමේ එම තොගය රු. මිලියන 16.87ක් විය. මේ අනුව ඒ අතර රු. මිලියන 14.66 ක ඌනතාවයක් පැවතියද එම ඌනතාවය පිළිබඳව පසු විපරම් කර විධිමත් පරිදි කටයුතු නොකර 2025 වර්ෂයේදි ලාභයෙන් කපා හැර තිබුණි.	ජර්නල් සටහන් මගින් මෙය සිදුකර ඇත.	තොග ඌණතාවයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඒ අනුව අදාළ කටයුතු සිදුකළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනත ප්‍රකාරව තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතා හඳුනා ගෙන දක්ෂතා දිරි ගැන්වීම සඳහා තරුණ ප්‍රජාව ගමෙන් නගරයට ගෙනවිත් දක්ෂතා එළි දැක්වීමට අවස්ථාව ලබා දීම අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වූ Water Polo - 2024 වැඩසටහන කොළඹ ප්‍රදේශයේ ජනප්‍රිය පාසැල්වලට පමණක් සීමා කර සභාව විසින් රු. මිලියන 5.84ක් වැයකර තිබුණි.	හිටපු සභාපති/අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් මෙම වැඩසටහන සංවිධානය කර ක්‍රියාත්මක කර ඇති බව වාර්තා කරමි.	වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කළ යුතු අතර එයට පටහැනිව ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය.

(ආ)	1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 4 (ඊ), 5(2)(උ) සහ 5(2)(ඌ) වගන්ති ප්‍රකාරව තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට ගොවිපොළවල් ආරම්භ කිරීම අරමුණ වුවද, සභාවේ පවතින ගොවිපොළ 10ක පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.	ඒ වන විට කෘෂි අංශය මගින් පවත්වාගෙන ගිය ගොවිපල 15ක පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.	වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කළ යුතු අතර එයට පටහැනිව ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් සංවිධානය නොකරන ලද, සභාවේ අරමුණු හා එකග නොවන කටයුත්තක් වෙනුවෙන් 2024 ජුනි 14 හා 15 සහ ජූලි 26 හා 27 දිනවල ගල්කිස්ස බර්ජායා හෝටලයේ පැවැත්වූ නැගී එන ක්‍රිකට් ක්‍රීඩකයින් 120 දෙනෙකු වෙනුවෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා සභාපතිවරයාගේඋපදෙස් පරිදි රු. මිලියන 2.98 ක් සභාව වැය කර තිබූ බව නිරීක්ෂණය විය. තව ද, මෙම වැඩසටහන සඳහා සහභාගී වූ ක්‍රීඩකයින් තෝරාගත් පදනම හා ඔවුන්ගේ දක්ෂතාවය ඇගයීමට ලක්කළ ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ලැබී නොතිබුණි.	වැඩසටහන සඳහා ක්‍රීඩා සමාජයේ අභ්‍යන්තර ආදායමෙන් ණය පදනම මත රු. 1,516,000.00 ක මුදලක් ලබාගෙන ඇති අතර මෙම මුදල හිටපු සභාපති / අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ උපදෙස් පරිදි ලබා ගැනීමට කටයුතු කර ඇති බව සඳහන් කරමි.	සභාවේ අරමුණු හා එකඟවන කටයුතු ඉටුකළ යුතු අතර එයට පටහැනිව කටයුතු කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	නිලාවේලි ගොවිපොළ සඳහා අක්කර 200ක ප්‍රමාණයක් ලබාදී තිබුණද, එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබාගැනීම සඳහා රු.මිලියන 2.31ක් වැයකරමින් පසුවද, එම අයිතිය මේ දක්වා ලබාගෙන නොතිබුණි. තවද, මෙම ඉඩමේ ආරක්ෂක කටයුතු සඳහා රු.මිලියන 25.66ක් ගෙවා තිබුණි.	මේ වන විටත් මෙම ඉඩමට පුද්ගලික ව්‍යාපාරිකයකු අයිතිය ප්‍රකාශ කරමින් නඩුවක් පවරා ඇත.	ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	නැගෙනහිර පළාතේ කළුගල්ඔය, නිලාවේලි ගොවිපොළවල් 02ක භූමි ප්‍රමාණයෙහි එකතුව අක්කර 60 ක් වුවද, එම ගොවිපොළවල් පවත්වා ගැනීමේ අරමුණ සඳහා භාවිතා කර නොතිබූ අතර, කළුගල්ඔය ගොවිපොළෙහි මස් සඳහා කුකුළන් ඇති කිරීම පුද්ගලික සමාගමකට පවරා දී තිබුණි.	කළුගල් ඔය අක්කර 27කින් සමන්විත ගොවිගල තුළ මේ වන විටත් ගස්ලබු,දොඩම්,අඹ ආදි වගාවන් ආරම්භ කර ඇති අතර ගොවිපල නිරන්තරයෙන් වන අලි ප්‍රහාර වලට ලක් වන ස්ථානයකි.	නිෂ්කාර්ය ඉඩම් ඵලදායීව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 මත භේදයට තුඩුදුන් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ නිළ නාමය හා නිල ලාංඡනය මෙන්ම රේඛීය අමාත්‍යාංශ නාමයද භාවිතා කරමින් සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමය පාඨමාලා පවත්වාගෙන යන අතර, මෙම සමූපකාර සමිතිය හා සභාව අතර පවතින නීත්‍යානුකූල සම්බන්ධතාවය පැහැදිලි නොවීය. තවද, ඉහත සමූපකාර සමිතියේ සභාපති, සාමාන්‍යාධිකාරී හා අධ්‍යක්ෂ මණ්ඩලයට සභාවේ නිළධාරීන් පූර්ණකාලීන හා අර්ධකාලීනව පත්කර තිබුණි.	සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා නෛතික වලංගු භාවයක් ලබාදීම හා එම කටයුතු සම්බන්ධව සුදුසු වැඩපිළිවෙලක් හා ඍජු නියාමනයක් ඇතිකිරීම සඳහා මේ වන විට කටයුතු සිදුකෙරෙමින් පවතී.	සභාව අමාත්‍යාංශය හා සමූපකාර සමිතිය අතර පවතින නීත්‍යානුකූල පසුබිම තහවුරු කළ යුතු අතර නීත්‍යානුකූල නොවන ආකාරයට සභාවේ නිල නාමය/ ලාංඡනය භාවිතා කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	සභාවට උපාධි සහතික පිරිනැමීමට නීත්‍යානුකූල අයිතියක් නොමැති වුවද පෞද්ගලික ආයතනයක් සමග එක්වී රූපලාවන්‍ය (විද්‍යා) කළමනාකරණය පිළිබඳ ආශ්‍රිත උපාධි සහතිකපත්‍ර (Associate Degree in Cosmetology (science) Management) සිසුන් 78 දෙනෙකු වෙත පිරිනමා තිබුණි. එසේ වුවද, මෙම සහතිකපත්‍ර පිරිනැමීම වෙනුවෙන් පාඨමාලා පැවැත්වූ බවට සාක්ෂි නොවූ අතර, සිසුන්ගෙන් අයකර ගත් මුදල් සම්බන්ධයෙන්ද කිසිදු කරුණක් විගණනය වෙත ඉදිරිපත් නොවීය.	මේ සම්බන්ධයෙන් සොයා බැලීමට අමාත්‍යාංශ මට්ටමින් කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුව මගින් මේවන විට ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.	සභාවේ අධිකාරී බලයට පරිබාහිර කටයුතු වල නිරත වූ නිලධාරීන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	සභාව යටතේ පවතින පුහුණු මධ්‍යස්ථානවල ජාතික වෘත්තීය සුදුසුකම් රහිත (Non-NVQ) පාඨමාලා පැවැත්වීමේදී සභාවේ පුහුණු අංශයෙන් අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ නොකර මධ්‍යස්ථාන 04ක් විසින් පාඨමාලා 02ක් පවත්වා තිබුණි. විගණනය විසින් ලබාගන්නා ලද තොරතුරු අනුව සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වූ පාඨමාලාවලින් රු.මිලියන 8.74 ක් උපයාගෙන තිබුණද, එම ආදායම් හා වියදම් සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේ දී මෙවැනි පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ දී විධිමත් ක්‍රමවේදයකට අනුව පූර්ව අනුමැතීන් සහිතව පැවැත්වීම සඳහා කටයුතු කෙරේ.	පූර්ව අනුමැතියක් සහිතව පාඨමාලා පැවැත්විය යුතු අතර නිසි අනුමැතිය ලබානොගත් පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඈ)	2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අධ්‍යාපන වැඩසටහන දියත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මුදා හරින ලද රු. මිලියන 168.97 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 166.17 ක් වැය කර තිබූ බව අනාවරණය විය. තවද එම මුදල උපයෝගී කර ගනිමින් පාඨමාලා 22 ක් පවත්වා තිබුණද, එම පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව හා අවසන් ඇගයීමට ලක් කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනය වෙත ලබාදී නොතිබූ බැවින් මෙම පාඨමාලාවල කාර්යසාධනය නිශ්චය කර ගැනීමටත් ඇගයීමටත් නොහැකි විය. මේ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක්ද සිදු කර නොතිබුණි.	2019 වර්ෂයේ සිට මේ දක්වා 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ සවිස්තරාත්මක තොරතුරු ඇමුණුම් අංක 04 යටතේ ඉදිරිපත් කරමි.	පාඨමාලාවල කාර්යසාධනය නිශ්චය කර ඇගයීම් කිරීමට හැකිවන පරිදි අවශ්‍ය තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(ඉ)	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, ව්‍යවහාරික තාක්ෂණ SLTC Campus (Pvt) Ltd සහ ජාතික තරුණ සේවා සභාව අතර 2022 වර්ෂයේ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව ව්‍යවහාරික තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි පාඨමාලා පවත්වා තිබූ අතර, එම පාඨමාලා සඳහා 2022 හා 2023 වර්ෂවල සිසුන් 915ක් හා 903 දෙනෙකු ලියාපදිංචි කර තිබුණද, ඒ සඳහා උපාධි සහතිකපත්‍ර පිරිනැමීමට අනුමැතිය ලැබී නොතිබුණි.	මේ වන විට පවතින තත්ත්වය මත SLTC ආයතනය විසින් මෙම පාඨමාලාව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත බව වාචිකව දන්වා ඇති අතර , අමාත්‍යාංශය මගින් ඉදිරි කටයුතු සංවිධානය කරමින් පවතී.	නිසි අධ්‍යනයකින් පසුව පමණක් අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය.
(ඊ)	සභාව විසින් පාඨමාලා පැවැත්වීමේදී සිසුන් සම්බන්ධයෙන් තොරතුරු නීත්‍යානුකූලව සභාවේ MIS පද්ධතියට ඇතුළත් කිරීමෙන් පමණක් පාඨමාලා පවත්වා ඇගයීමට ලක්කර සහතිකපත් නිකුත් කිරීම ප්‍රධාන කාර්යාලය විසින් පමණක් සිදුකළ යුතු වුවද, ඊට පටහැනිව නායකත්ව හා මෘදු කුසලතා ගොඩනැගීම සහ ජාත්‍යන්තර භාෂා පුහුණු වැඩසටහන මාතර දිස්ත්‍රික් කාර්යාලය විසින් පවත්වා රු.මිලියන 3.35 ක් වැයකර, සිසුන් 315ක් සඳහා දිස්ත්‍රික් කාර්යාලය විසින් සහතිකපත් නිකුත් කර තිබුණි. මෙසේ නිසි අධීක්ෂණයක් නොමැතිව සහතිකපත් නිකුත් කිරීමේ ක්‍රමවේදය නිසා තරුණ සේවා සභාවේ සහතිකවල	කාර්මික හා වෘත්තීය පුහුණු අංශයේ නිසි අනුමැතියකින් තොරව මාතර දිස්ත්‍රික් කාර්යාලය විසින් පවත්වා තිබූ නායකත්ව හා මෘදු කුසලතා ගොඩනැගීම සහ ජාත්‍යන්තර භාෂා පුහුණු වැඩසටහන සඳහා ලබාදෙන ලද සහතික පත්‍ර MIS පද්ධතියට ඇතුලත් කර නොමැත.	පාඨමාලා පැවැත්වීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර නීතිරීති වලට පරිබාහිරව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

	ප්‍රමිතිගතභාවය හා පිළිගැනීම අඩුවීම සිදුවී ඇති බවත්, එයින් පුහුණුලාභීන්ට රැකියා අවස්ථා සඳහා යොමු වීමේ දී එම සහතික පත්‍ර අඩු කත්සේරුවකට භාජනය වන බව නිරීක්ෂණය විය.		
(උ)	සභා තීරණයක් නොමැතිව සභාපතිවරයාගේ අභිමතය පරිදි හල්දුම්මුල්ල ප්‍රදේශයේ පාසැල් සිසුන්ට ආධාර ලෙස රු.628,050ක් වැයකර පාසල් පොත්, පාසල් උපකරණ හා කුසලාන මිලදීගෙන සිසුන් වෙත ලබාදීමට ඌව පළාත් කාර්යාලය මගින් කටයුතු කර තිබුණි.	එවකට සිටි සභාපති/අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත, ඌව පළාත් කාර්යාලයට ප්‍රතිපාදන නිදහස් කිරීම තුළින් ඌව පලාත් කාර්යාලයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.	වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යොමු කිරීමට කටයුතු කළ යුතු අතර එයට පටහැනිව කටයුතු කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඌ)	1979 අංක 28 දරන දේශිය ආදායම් පනතේ 03 (9) (අ) වගන්තිය යටතේ පුණ්‍යායතනයක් ලෙස පිහිටුවා ඇති ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය නීත්‍යානුකූල නොවන පදනමකින් ජාතික තරුණ සේවා සභාව සමග සම්බන්ධව සිටී .ප්‍රධාන කාර්යාලයේ අංශයක මෙම සම්මේලනය පිහිටුවා සම්මේලනයේ සාමාජිකයන් 10 දෙනෙකුට 2018 වර්ෂයේ සිට මසකට රු.750 ක් බැගින් සභාව විසින් දීමනා ගෙවා තිබුණි .මෙම සම්මේලනයේ සභාපතිවරයා, සභාවේ සභාපතිවරයාද වේ.	2018.08.16 දිනැති අංක 20/2018 දරණ සභා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම රු.750/- දීමනාව ගෙවීම් කර ඇත. මෙම තත්ත්වය මේ වන විට නිරවුල් කර ඇත.	සභාව හා යෞවන සමාජ සම්මේලනය අතර පවතින නීත්‍යානුකූල පසුබිම තහවුරු කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘෂි සංවර්ධන අංශයේ මධ්‍යම පළාත් පුහුණු මධ්‍යස්ථාන 03ක් තුළ රු. මිලියන 4.5ක් වැයදරා ආරක්ෂිත ගෘහ (Polytunnel) ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා අත්තිකාරම් ගෙවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i) හා ඒ සඳහා වූ අතිරේක පත්‍රිකා අංක 29 ට පටහැනිව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට හතළිහක් වූ රු. මිලියන 2ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.	කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී 40% ක අත්තිකාරම් මුදලක් ලබාදීමට සිදු වූයේ මෙම කාලවකවානුව තුළ අදාල අමුද්‍රව්‍යවල මිල ගණන් අධික ලෙස ඉහල මට්ටමක පවතිනා බැවින් තෝරා ගත් ආයතනය අප විසින් ලබාදීමට තීරණය කළ අත්තිකාරම් මුදල ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කිරීම හා වර්ෂ අවසානවීමට පෙර මෙම ඉදිකිරීම සිදුකර අවසන් කර ගත යුතු වූ බැවිනි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර එම නීති උල්ලංඝනය කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	තවද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ආයතනය සමග ඇති කරගත් දින රහිත ගිවිසුමේ 02 හා 03 වගන්ති අනුව කාර්මික නිළධාරියෙකුගේ නිර්දේශය මත පදනම්ව බිල්පත් සඳහා ගෙවීම් සිදු කරන බවට දක්වා තිබුණද එලෙස තාක්ෂණික නිලධාරියෙකුගේ නිර්දේශයකින් තොරව රු. මිලියන 2.99 ක ගෙවීම් කර තිබුණි.	මධ්‍යස්ථාන භාර නිලධාරින් විසින් මෙම පොලිටනල් අඩුපාඩුවකින් තොරව සකසා භාරදුන් බවට ලබාදුන් ලිඛිත ප්‍රකාශයන් පදනම් කරගෙන අවසාන බිල්පත සඳහා ගෙවීම් සිදු කර ඇත.	ගිවිසුමේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර එයට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	පුහුණු අංශය සඳහා ටී-ෂර්ට් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් වර්ග මීටරයකට ග්‍රෑම් (GSM) නොමැති බව දක්වා සැපයුම්කරුවන් 05 දෙනෙකු ප්‍රතික්ශේප කර තිබුණද, තෝරාගත් සැපයුම්කාර ආයතනයේද වර්ග මීටරයකට ග්‍රෑම් (GSM) අගය පරීක්ෂාවකින් තොරව නිර්දේශ කර තිබු අතර, ඒ අනුව අවම මිලට ලබාගත හැකිව තිබූ අවස්ථාව අහිමි වීම මත සභාවට රු. මිලියන 1.25ක පාඩුවක් සිදුවී තිබුණි.	ටී ෂර්ට් සපයා ගැනීමේදී කමිටුව අවධානය යොමු කර ඇත්තේ එවක සභාපතිවරයා විසින් ලබා දී තිබූ උපදෙස් පරිදි ටී ෂර්ට් නිර්මාණය වෙත බව කමිටුවේ ප්‍රධාන නිර්දේශයෙන් සනාථ වේ.	රජයට උපරිම ආර්ථික ප්‍රතිලාභ සිදුවන පරිදි ප්‍රසම්පාදනය සිදුකළ යුතු අතර රජයට අලාභ සිදුකළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව 707 ක් බව විගණනය වෙත වාර්තා කර තිබුණද, එය 707ක් නොව 281ක් පමණක් බව සභාවේ ලිපිලේඛණ පරීක්ෂාවේදී තහවුරු විය. එබැවින් ව්‍යාජ ලෙස පිළියෙළ කරන ලද සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් මත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු සිදුකළ බවද නිරීක්ෂණය විය.	සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයේ පිළියෙල වී ඇත්තේ ඒ ඒ සැපයුම් විෂයට අදාළව බැවින් එක් සැපයුම්කරුවෙකුගේ නම කිහිප ස්ථානයක සටහන් වීමෙන් සැපයුම්කරුවන් 707ක් ලෙස මෙම විගණන නිරීක්ෂණය තුල සටහන් වී ඇත.	ව්‍යාජ ලේඛන පිළියෙල කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඉ)	ජාත්‍යන්තර තරුණ දිනය හා සමගාමීව ප්‍රාදේශීය බල මණ්ඩල සඳහා ක්‍රීඩා භාණ්ඩ බෙදාදීම හා එඩින්බරෝ ආදිපාද තිළිණ ප්‍රදානෝත්සවය වෙනුවෙන් අවශ්‍ය සේවාවන් සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පෞද්ගලික ආයතනයකට රු. මිලියන 5.86ක් අධ්‍යක්ෂ ජනරාල්ගේ වාචික උපදෙස් මත ගෙවා තිබුණි.	ප්‍රසම්පාදන කාර්යයන් එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්ගේ වාචික උපදෙස් මත සිදුකරන ලදී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු අතර එම මාර්ගෝපදේශ උල්ලංඝනය කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඊ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.9.1 මාර්ගෝපදේශයට අතිරේකව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු 01 දින නිකුත් කරන ලද 32 වන අතිරේකය අනුව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ සහ ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කරනු ලබන ප්‍රසම්පාදන රැස්වීම්වලට සහභාගී වන නිලධාරීන්ට දීමනා ගෙවීම් නොකළ යුතු වුවද ,ඊට පටහැනිව 2024වර්ෂයේදී රු. මිලියන 1.56ක් දීමනා ගෙවා තිබුණි.	මේ වන විට අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා ලිපි යොමුකර ඇත.	අයකර ගත යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුය.
(උ)	ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෙකු ලෙස ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් ඇති ආයතනයකින් රු.786,700ක ටී-ෂර්ට් මිලදී ගෙන තිබුණද, ඒවා බෙදාහැරීම පිළිබඳ කිසිඳු ලේඛණයක සටහන් වී නොතිබුණි. මෙම ප්‍රසම්පාදනයට අදාළ ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයන් ලෙස සහභාගී වූ බවට අත්සන් යොදා තිබුණු නිළධාරින් දෙදෙනෙකු එදින රාජකාරී සඳහා නොපැමිණි නිළධාරීන් විය. තවද, ලංසු ලේඛන විවෘත කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබා ගැනීම, ප්‍රසම්පාදන කමිටු වාර්තා ලබා ගැනීම යනාදිය එකම දින සිදු කර තිබීම ප්‍රායෝගිකව සිදු විය නොහැකි බව නිරීක්ෂණය විය. මෙම වැඩසටහන සඳහා සහභාගී වූ ක්‍රීඩකයන්ගේ නාම ලේඛනයේ 85 දෙනෙකු ලෙස සඳහන් වුවත් ටීෂර්ට් 490 ක් බෙදා දී තිබුණි.	මේ වන විට මෙම තත්වය නිවැරදි කර ඇති අතර සැපයුම්කරුවන් ලියාපදිංචියේදී ඔවුන්ගේ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සඳහන් සැපයුම් ක්ෂේත්‍ර සඳහා පමණක් සැපයුම් ක්ෂේත්‍රය ලේඛණගත කර ගැනීමට කටයුතු කර ඇත.	රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයට පටහැනිව කටයුතු කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතු අතර රජයට පාඩුවක් සිදුවී ඇත්නම් නොපමාව අයකර ගත යුතුය.
(ඌ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල අනුයුක්ත කර ඇති තරුණ සේවා නිළධාරීන් සඳහා බෙදා හැරීමට ක්‍රීඩාභාණ්ඩ වර්ග 05 සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසු කරුවන්ගෙන් මිලදී ගැනීම් සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා රු.මිලියන 4.35 ක වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.	මෙම භාණ්ඩ ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් ගේ තරඟ සඳහා මෙන්ම පුහුණු කටයුතු සඳහා භාවිතා කළ අතර, දීර්ඝ කාලයක් පාවිච්චි කිරීමට හැකි කල්පැවැත්මක් සහිත භාණ්ඩ තෝරා ගැනීමට කමිටු නිර්දේශ ලබා දී තිබුණි.	රජයට උපරිම ප්‍රතිලාභ ලබා ගැනිමට හැකි වන පරිදි ප්‍රසම්පාදනය සිදු නොකළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතු අතර සිදුකල පාඩුව අයකර ගත යුතුය.

(එ)	වටිනාකම රු.මිලියන 147.45 ක්වූ බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයෙහි ඉදිකිරීම්, ප්‍රසම්පාදන කටයුතු අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මගින් කළ යුතු වුවද, එම කොන්ත්‍රාත් වටිනාකම කොටස් 02 කට බෙදා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකර තිබුණි. නමුත් මෙම ඉදිකිරීම් කටයුතු මේ දක්වා නිමකර නොතිබුණි.	ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ වල කොටසක් ඉටු කිරීම සඳහා අවශ්‍ය උපදේශක සේවය සපයා ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී .ඉන් අනතුරුව ලැබී ඇති ප්‍රතිපාදන මත ඉංජිනේරු ඇස්තමේන්තු සිදු කර,කාර්යය ඉටු කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව දැනුම් දෙමි.	නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් කාර්මාන්තය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

3.6 නිෂ්කාර්ය වත්කම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2025 ජනවාරි 31 දින වන විටත් අදාළ ප්‍රාදේශීය බල මණ්ඩලවල තරුණ සේවා නිළධාරීන් වෙත ලබාදී තිබුණු රු. මිලියන 15.44ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ වර්ග 11ට අදාළව භාණ්ඩ 251ක් ගබඩාව තුළ නිෂ්ක්‍රියව පැවතුණි. එසේම සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ රොබෝටික් පුහුණු පාඨමාලාවක් ආරම්භ කර නොතිබීමෙන් එම පාඨමාලාව සඳහා මිලදීගත් රු. මිලියන 17.42ක උපකරණ නිෂ්කාර්යව පැවතුණි.	සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයට ලබාගත් රොබෝටික් (වායු පීඩන කාර්මික ශිල්පී) පුහුණු පාඨමාලාවේ උපකරණ රත්මලාන පුහුණු මධ්‍යස්ථානයට මාරු කර ඇති අතර පුහුණු පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි.	නිෂ්කාර්ය වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	පැල තවාන් සංවර්ධන සහයක පාඨමාලාව සහ කෘෂි ක්ෂේත්‍ර පාඨමාලාව හදාරන අභ්‍යාසලාභීන්ගේ ප්‍රයෝජනය සඳහා දඹුල්ල ස්විස් පුහුණු මධ්‍යස්ථාන භූමියේ රු. මිලියන 2.30 ක් වැය කර ඉදිකර තිබුණු ආරක්ෂිත ගෘහය හා එහි ජල සැපයුම් පද්ධතිය නිෂ්කාර්යව පැවතුණිග	දඹුල්ල ස්විස් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකර තිබූ ආරක්ෂිත ගෘහයේ ජල සැපයුම් පද්ධතිය විගනිත දිනය වන විට ස්වයංක්‍රීය පද්ධතියට අදාල සම්බන්ධතාවය ලබාදී නොතිබූ අතර, (මෘදුකාංගය) වගාව සඳහා අවශ්‍ය ජල සැපයුම් ජලනල පද්ධතිය හරහා අතින් ක්‍රියාක්මන කර තිබුණි.	නිෂ්කාර්ය වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ජාතික සමාජ මාධ්‍ය ජාල සම්මාන ප්‍රදාන උළෙල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 6.24ක් වියදම් දරා තිබුණද එම උළෙල පවත්වා නොතිබුණි. එබැවින් දරන ලද එම වියදම නිෂ්කාර්ය වියදමක් බව විගණනයේදී නිරීක්ෂනය විය.	ජාතික සමාජ මාධ්‍ය ජාල සම්මාන ප්‍රදාන උළෙල පැවැත්වීමට පූර්වයෙන් පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාව සඳහා වීඩියෝවෝල් සපයා ගැනීම් සම්බන්ධයෙන් ගෙවීම් කිරීම සඳහා සකස් කරන ලද පසුවිපරම් වාර්තාව එවකට සිටි සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් නියෝග හා දැඩි ඉල්ලීම මත නිළධාරීන් විසින් අත්සන් කර ඇති	රජයට පාඩුවක් වන අයුරින් වැඩසටහන් සංවිධානය කළ පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතු අතර එම පාඩුව අයකර ගත යුතුය.

			අතර විදුලි උත්පාදක හා වීඩියෝ වෝල් 30ක් සපයා ගැනීම සිදුකර නොතිබූ බවට කරුණු අනාවරණය වේ.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුමත සමස්ථ කාර්ය මණ්ඩලයේ තනතුරු 385ක් පුරප්පාඩුව පැවති අතර, තනතුරු 14ක් අතිරික්තව පැවතුණි. අධ්‍යක්ෂ තනතුරු නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ (මුදල්) හා අභ්‍යන්තර විගණක ඇතුළු විධායක හා මාණ්ඩලික මට්ටමේ තනතුරු 25 ක් දීර්ඝ කාලීනව පුරප්පාඩුව පවතින අතර 2016 නොවැම්බර් 11 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති කොන්දේසි අංක 01ට පටහැනිව විධායක හා මාණ්ඩලික මට්ටමේ තනතුරු සඳහා අනුමත සීමාව ඉක්මවා වැඩ ආවරණ තනතුරු 82ක් ලබාදී තිබුණි. තවද, පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වෙනුවෙන් අනුප්‍රාප්තික සැළැස්මක් පිළියෙල කර ඒ අනුවද කටයුතු කර නොතිබූ අතර සභාවේ ප්‍රධානම මාණ්ඩලික තනතුරු 03ක් වන අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ (සංවර්ධන) හා අධ්‍යක්ෂ (පුහුණු) තනතුරු සඳහා ස්ථිර පදනමින් පත්වීම් සිදු නොකර ද්වීතීය හා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීමට වසර 12ක සිට කටයුතු කර තිබුණි.	බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් පසුව අදාල බඳවා ගැනීම් සිදු කරනු ලබන බව සඳහන් කරමි.	බඳවාගැනීමේ අනුමැතිය කඩිනමින් ලබාගෙන ඵලදායී ලෙස බඳවාගැනීම් සිදුකළ යුතුය.
(ආ)	නුපුහුණු ලිපිකරුවන් 15 දෙනෙකු හා නුපුහුණු කම්කරුවන් 03 දෙනෙකු 2021 වර්ෂයේ සිට 2024 දක්වා බඳවා ගෙන ප්‍රදාන කාර්යාලයේ විවිධ අංශ වලට හා පුහුණු මධ්‍යස්ථාන වලට අනුයුක්ත කර රු.මිලියන 15.74 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.	සේවා අවශ්‍යතාව මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත නුපුහුණු ලිපිකරුවන් හා කම්කරුවන් බඳවාගෙන ගෙවීමට කටයුතු කර ඇත.	නිසි අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය බඳවා නොගත යුතුය.

4. අනෙකුත් කරුණු

(අ) 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල පරිච්ඡේදය තුළදී ජාතික තරුණ සේවා සභාව විසින් තාරුණ්‍ය පීඩාවෙන් මුදවාගැනීම යන තේමාව යටතේ සිදුකරන ලද වැඩසටහන් 06ක විධිමත්භාවය, ඵලදායීත්වය සභාවේ ප්‍රමුඛ අරමුණුවලට අනුකූලතාවය පිළිබඳව විශේෂ විගණනයක් සිදුකර 2025 අප්‍රේල් 02 දින එම විගණිත වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබූ අතර, එම වාර්තාවේ ඇතුළත් විගණන නිර්දේශ මෙම වාර්තාවේ දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2025 පෙබරවාරි 18 හා 20 දිනවලදී සහ 2025 මාර්තු 19 දින පැවති පිළිවෙළින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) හා එම කාරක සභාවේ අනු කමිටු සාකච්ඡා සටහන් අනුව සභාව ඉටුකළ යුතු පහත සඳහන් කමිටු නිර්දේශ මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

i. රජයේ ප්‍රතිපත්ති පිළිබඳව සැළකිලිමත් වෙමින් යාවත්කාලීන සංයුක්ත සැලැස්මක් සකස් කර මාස 03 ක් ඇතුළත අනු කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

ii. රු.මිලියන 6.87 ක ණය ශේෂ 144 ක් කපා හැරීමට අදාළව මෙතෙක් භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගැනීමට හේතු හා වගකිව යුතු නිලධාරීන් පිළිබඳ මසක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.

iii. සභාව යටතේ පවතින සියළුම ඉඩම් සම්බන්ධයෙන් අදාළ අනුමැතීන් ලබා ගත යුතු වුවද, සභාව බුක්ති විඳින ඉඩම් 90 කින් 79 ක් සභාව සතු නොවූ අතර 11 ක් තැගි සින්නක්කර ඉඩම් විය. මේ පිළිබඳ අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම